# දූෂණයට තිත: සංවර්ධන වැඩපිළිවෙළකට සූදානම්

බද්දේගම ප්‍රා. සභා අපේක්ෂක-**කුලසිරි මාඉටිපේ** (ජාජබ)

**බද්දේගම මධ්‍යම විශේෂ - ජස්ටින් පතිරගේ**



"මම පසුගිය වසර පහක් බද්දේගම ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයකු ලෙස කටයුතු කළා. මෙවරත් මා කීඹිය ප්‍රදේශයෙන් තරග කරනවා. අපි විපක්ෂයේ සිටි නිසා අපට සභාවෙන් කිසිදු ප්‍රතිපාදනයක් ලැබුණේ නැහැ. නමුත් මම මගේ පෞද්ගලික වියදමින් හා පක්ෂයේ අරමුදලින් ප්‍රදේශයට විශාල වැඩකොටසක් කළා. වතු නිවාසවලට පානීය ජලය ලබා ගන්න ළිං තනා දුන්නා. ඊට අමතරව සිලින්ඩර, ගමේ සමිති සමාගම් සඳහා භාණ්ඩ ලබා දුන්නා. කොහොම නමුත් වසර පහක් තුළ අපට විපක්ෂයක් වශයෙන් සිටි නිසා ජනතාවගේ අවශ්‍යතාවයන් නිසි පරිදි ඉටුකර දීමට හැකියාවක් ලැබුණේ නෑ. ජාතික ජනබලවේගයේ රජයක් දැන් අප පිහිටුවාගෙන තිබෙනවා. බද්දේගම ප්‍රාදේශීය සභාවේ බලයත් අපේ අතට අරන් සභාවට අයත් සියලුම ගම්මාන සංවර්ධනය කිරීමට අප මේ වන විට සියලු කටයුතු සූදානම් කොට තිබෙනවා. මැතිවරණයෙන් පසු ඒ සියල්ල ඉටු කරන්න අපට හැකියාව තිබෙනවා.

බද්දේගම ප්‍රාදේශීය සභාව ඇතුළු මුළු දිවයිනේම ප්‍රාදේශීය සභා ජන බලය ජාතික ජනබලවේගයට ලබා දෙනු ඇතැයි අප විශ්වාස කරනවා. මෙතෙක් පැවැති දූෂණ ක්‍රමය නැති කොට නව ක්‍රමයක් පළාත් පාලන ආයතන හරහා ඉටු කරන්නට වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට අප මේ මොහොතේ සූදානමින් සිටිනවා."

# බදු මුදලට වංචා නොකළොත් රත්නපුර මහනගර සභාවට රජයේ මුදල් අවශ්‍ය නෑ

රත්නපුර මහනගර සභා අපේක්ෂක
**නලින් විජයගුණවර්ධන** (එජාප)

**රත්නපුර විශේෂ එන්.පී. රාජදොරේ**



රත්නපුර මහනගර සභාවේ පාලනය පසුගිය වර එක්සත් ජාතික පක්ෂය හවුල් පාලනයක් යටතේ ගෙනගියත් මෙවර 2025 පළාත් පාලන මැතිවරණයේදී මගේ කණ්ඩායම් නායකත්වයෙන් තරග කරන කණ්ඩායම විශිෂ්ට ජයක් අත්කරගෙන රත්නපුර මහනගර සභාවේ බලය හිමිකර ගන්න සූදානම්. මෙවර මාත් සමඟ ගමේ ජනතාවගේ ගුණ සුවඳ හඳුනන අලුත් කණ්ඩායමක් තරග කරනවා. මෙහි විශේෂයක් වන්නේ මුස්ලිම් කාන්තාවක් ද තරග කිරීමයි. අප කණ්ඩායම සියලුම ජාතීන් නියෝජනය වන පරිදි අපේක්ෂක අපේක්ෂිකාවන් ඉදිරිපත් කර තිබෙනවා.

රත්නපුර මහනගර සභාව කියන්නේ රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරය වන රත්නපුර නගරය පාලනය වන ප්‍රධාන පළාත් පාලන ආයතනයයි. මෙම ආයතනයෙන් වංචා දූෂණයෙන් තොරව බදු ගෙවන ජනතාවගේ මුදල් නියමාකාරයෙන් එකතු කළොත් මධ්‍යම රජයේ මුදල් නොමැතිව පවත්වාගෙන යන්න පුළුවන්. අද නගරයේ නගර සභාව ඉදිරියෙන් යන්න බැහැ ගඳ ගහනවා. නමුත් බදු ගෙවන ජනතාවට කුණු දමනවා කියා දඩ ගහනවා. මගේ පාලනයක් යටතේ නගරය නිසි පරිදි පිරිසුදු කිරීම් කර රත්නපුර මහනගර සභා සීමාවේ පදිංචි බදු ගෙවන ජනතාවට සියලු පහසුකම් සලස්වනවා" යැයි පැවසීය.



# ගමේ සටනින් ඇසුණු කතා

# දින්නොත් මගේ වැටුප වැය කරන්නේ දුගී පවුල් හා දරුවන්ටයි

බද්දේගම ප්‍රා. සභා අපේක්ෂක
**කේ. ජාගොඩගේ විමලරත්න**
(සර්ව ජනබලය)

**බද්දේගම මධ්‍යම විශේෂ ජස්ටින් පතිරගේ**



"පාසල් කාලයේ සිට මගේ ආසාවක් තිබුණා දේශපාලනයට පිවිසෙන්න. මම හිටපු දේශපාලනඥයන් දෙදෙනකුගේම ලේකම් වශයෙන් සේවය කළා. එදා ඒ අයගේ දේශපාලන කටයුතු කළේ මගේ පුද්ගලික ධනය වැය කරලා. 2016දී මගේ නම බද්දේගම ප්‍රාදේශීය සභාවට යෝජනා කළත් පසුව කැපුවා.

මෙවර මම තීරණය කළා සර්ව ජනබලය පක්ෂයෙන් බද්දේගම නගරයෙන් ප්‍රාදේශීය සභාවට සභිකයකු ලෙස ඉදිරිපත් වෙන්න. මා සභිකයකු ලෙස පත්වුවහොත් මට ලැබෙන මාසික වේතනයෙන් සමෘද්ධිය ලැබෙන දුගී පවුල්වලට සහ ඒවායේ දරුවන්ගේ අධ්‍යාපනය සඳහා පොත් පත් ලබා දීමට පියවර ගන්නා අතර, සමාජයට විශාල සේවාවක් කිරීම සහ ගමට නගරයට සේවයක් කිරීමට බලාපොරොත්තු වෙනවා."

# තවමත් සංවර්ධනයක් නැති දඹුල්ලේ සියලු පහසුකම් නංවනවා

දඹුල්ල නගර සභා අපේක්ෂක
දේශබන්දු **ප්‍රසන්න ජයවීර** (සජබ)

**තක්ෂිලා උදයංගනී**



"දඹුල්ල නගරය නොනිදන නගරයක් බවට ප්‍රසිද්ධව තිබුණත් ඒ සඳහා සුදුසු පහසුකම් තවමත් සංවර්ධනය වී නෑ. එනිසා නව පාලනයක් යටතේ එම පහසුකම් ක්‍රියාවට නංවන්න බලාපොරොත්තු වෙනවා. ඒ වගේම දඹුල්ල ආශ්‍රිතව ආබාධිත පුද්ගලයන් පන්සියයක් පමණ ඉන්නවා.

ඒ සියලු දෙනාට හස්ත කර්මාන්ත අංශයේ රැකියා අවස්ථා ලබා දීමට කටයුතු කරනවා. ඒ තුළින් සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කරනවා. එමෙන්ම පදික වේදිකාවේ වෙළෙඳාම් කටයුතු කරන පිරිසට ස්ථිර රැකියා ස්ථාන ලෙස කඩ කාමර ලබා දීමට අවශ්‍ය පියවර ගන්නවා.

දඹුල්ල නගරයේ තිබෙන කුඩා වැව් හයක් මේ වන විට හඳුනාගෙන තිබෙනවා. එම වැව් සංචාරක කර්මාන්තයට අදාළ වන පරිදි ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නත් පියවර ගන්නවා.

මේ සඳහා රජයේ මුදල් යොදවන්නේ නැතිව දානපතීන් ඇතුළු පිරිසකගේ දායකත්වය ලබා ගැනීමට අපේක්ෂා කරනවා. මේ සියල්ලෙන්ම දඹුල්ල නගර සභාවට ආදායමක් අරන් දී ජනතාවගේ පහසුකම් සංවර්ධනය කිරීමට අවශ්‍ය කටයුතු සකස් කරනවා."

# තරුණ තරුණියන් ව්‍යවසායකයන් කරන දැවැන්ත වැඩකට සූදානම්

මැදවච්චිය ප්‍රා. සභා අපේක්ෂක
**වැලිකල ප්‍රසාද්** (පොඑපෙ)

**කැබිතිගොල්ලෑව සමූහ එස්.පී.උබේපාල**



"මැදවච්චිය ප්‍රාදේශීය සභාවේ මෙවරත් බහුතර බලය ලැබෙන්නේ පොදුජන එක්සත් පෙරමුණටයි. අප එහි දූෂණයට තිත තබනවා. මම අවුරුදු ගාණක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තරුණ පෙරමුණ නියෝජනය කළ කෙනෙක්.

ජාතික තරුණ සේවා සභාවේ ක්‍රියාකාරී සාමාජිකයෙක්. ඒ අනුව ලැබූ පන්නරයෙන් ඉදිරියේදී මැදවච්චියේ තරුණ, තරුණියන් ව්‍යවසායකයන් බවට පරිවර්තනය කිරීමේ දැවැන්ත කර්තව්‍යයට අත තබන්න සූදානම්.

ඒ අනුව මැදවච්චිය තරුණ, තරුණියන් දෙපයින් නඟා සිටුවනවා. ඒ වගේම ඩීල් සහ ගේම් දේශපාලනය නතර කරන්න අප සූදානම්. අපේ කොඳු නාරටිය වූ වෙළෙඳ ප්‍රජාව රැකගෙන යන්න පුළුවන් නව ගමනක් ඉදිරියේදී මැදවච්චිය ප්‍රාදේශීය සභාව තුළ ස්ථාපිත කරනවා. ඒ සඳහා සුදුසු නව බලධාරීන් ගෙන්වාගෙන කාර්යය මණ්ඩල සමඟ සුහදව මැදවච්චිය ප්‍රාදේශීය සභාව නව මාවතක් වෙත ගෙනයන්න සූදානම්.

ඒ සඳහා නිරන්තර සහාය දෙන්න වගේම වැරදි දේ වැරදියි කියන්න පුළුවන් ශක්තිමත් පිරිසක් අප ළඟ ඉන්නවා. ඉදිරියේදී මැදවච්චිය ප්‍රාදේශීය සභාවේ ගේට්ටුවෙන් කිසිදු පාරිභෝගිකයකුට, සේවා ලාභියකුට අසතුටින් පිටව යන්න ඉඩ තියන්නෙ නෑ.

ඒ සඳහා මෙවර නවකයන් රැසක් තරග බිමට ඉදිරිපත් වෙලා ඉන්නවා. අපට දේශපාලන වශයෙන් බෙදාගන්න දෙයක් නෑ. අපි ජනතාවට දෙයක් දෙන්න උපරිම වෙහෙස මහන්සි වෙලා වැඩ කරනවා. "

# ගම සංවර්ධනය කළේත් කරන්නේත් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ විතරයි

-රත්තොට ප්‍රා. සභා අපේක්ෂක-**අයි.ජී. නිශාන්ත බණ්ඩාර** (ශ්‍රීලපොපෙ)

**තක්ෂිලා උදයංගනී**

"ගම සංවර්ධනය කළේත්, ඉදිරියේදී ගම සංවර්ධනය කරන්නේත් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණයි. රත්තොට ප්‍රාදේශීය සභාවට ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙන් අප ඉදිරිපත් වෙනවා. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ කියන්නේ මේ රටේ බිහිවුණු ප්‍රතිපත්තිගරුකම පක්ෂය. ඒ වගේම ගමට වැඩියෙන්ම වැඩ කර තියෙන පක්ෂය වන්නේත් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණයි. මම හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක්. ගම වෙනුවෙන් විශාල වැඩ කොටසක් කළා. දැඩි ලෙස අබලන්ව තිබූ පාරවල් ප්‍රතිසංස්කරණය කළා. ජනතාවට විදුලි පහසුකම් ලබා දුන්නා. ගමේ ජනතාවගේ දැවෙන ප්‍රශ්න අපට හොඳින් තේරෙනවා. ඒ අපි ගමත් සමඟ නිරන්තරයෙන් කටයුතු කරන නිසයි. ගමේ සංවර්ධනය වෙනුවෙන් ඉදිරියේදීත් විශාල වැඩ කොටසක් ඉටු කිරීමට අපේක්ෂා කරනවා."



# මැදවච්චිය ප්‍රාදේශීය සභාව ජනතාවාදී සභාවක් කරනවා

මැදවච්චිය ප්‍රා. සභා අපේක්ෂක - **සුජීව සෝමපාල** (සජබ)

**කැබිතිගොල්ලෑව සමූහ එස්.පී. උබේපාල**

"මහජන නියෝජිතයන් නොමැති කාලයේ නිසි පාලන ක්‍රමවේදයෙන් බැහැරව මහජන සේවාවන් සහ වෙළඳ ප්‍රජාව අමතක කර දැමූ මැදවච්චිය ප්‍රාදේශීය සභාව නැවත ජනතාවාදී සභාවක් බවට පරිවර්තනය කරනවා.නොහැකියාවෙන් සේවා ලාභීන්ට සහ සේවකයන්ට අපායක් වූ මැදවච්චිය සභාව නැවත මැයි 06 වැනිදායින් පසු පණ දෙන යුගයක් කරා ගෙනයන්න මෙවර හොඳ කණ්ඩායම් රැසක් මැතිවරණයට තරග කරනවා. ගොඩාක් නවක මුහුණු එහි තිබෙනවා. අපි දන්නවා සමගි ජන බලවේගය වටා මැදවච්චියේ දැවැන්ත පිරිසක් අත්වැල් බැඳගෙන ඉන්නවා කියන කාරණාව. මේ ආසනය ජනාධිපතිවරණයේදී පවා සමගි ජන බලවේගය ජයග්‍රහණය කළ ආසනයක්. මහජනතාවගේ වගකීම් භාරගන්න පුළුවන්, දේශපාලන පක්ෂයකට කොටු නොවුණු, සියලු මහජනයාට සේවාවන් සැපයිය හැකි පොදු අපේක්ෂකයන් ඉන්න කණ්ඩායම සමගි ජන බලවේග කණ්ඩායම බව කිවයුතුයි.



අපි අලුත් ගමන ආම්භ කරන්න ඕනේ දැන් සභාව වැටිලා තියෙන තැන ඉඳලා. මේ සභාව සභා තරග අතරින් ඉදිරියෙන් තිබුණු සභාවක්. දැන් මහජන නියෝජිතයන් නොමැති කාලයේ ජනතා සේවාවන්වලට තිත තබපු සභාවක් වෙලා. මේ සභාවේ ග්‍රාමීය ජනයාගේ ගෙන්ගෙට ගොස් පානීය ජලය බෙදා දීමේ ව්‍යාපෘතියක් තිබුණා. ඒවා ප්‍රජා සත්කාර ලෙස නම් කරලා තිබුණේ. වත්මන් බලධාරීන් ඒවා මුදලට සීමා කරලා නවත්තලා දාලා. සභාවේ කෝටි ගණන් වටිනා ජල බවුසර් දෙකක් දිරනවා. කිසිම පහසුකමක් අවශ්‍ය වෙලාවට ජනතාවට ලැබෙන්නේ නෑ කියලා මිනිස්සු අපට කියනවා. හැම තැනම වංචා දූෂණ. ඒ සියල්ල පිළිබඳ විධිමත් පරීක්ෂණ සභාවට ආ සැණින් ආරම්භ කරනවා.

අපි ටෙන්ඩර්වලට වියදම් ගිය විදිහ, මහජන මුදලින් සභාව මිලදී ගත් සියලුම දෑ පිළිබඳ භාණ්ඩෙන් භාණ්ඩය, ආයතනයෙන් ආයතනයට ගොස් සොයා බැලීමක් කරනවා. අනතුරුව නීති ක්‍රියාත්මක කරනවා."

# රට දැය වෙනුවෙන් ඕනෑම අභියෝගයකට සූදානම්

බද්දේගම ප්‍රා. සභා අපේක්ෂක - **ජනිත චතුරංග** (එ.ජා.ප.)

**බද්දේගම මධ්‍යම විශේෂ ජස්ටින් පතිරගේ**



"මගේ පියා වන විශ්‍රාමික පොලිස් නිලධාරී පියල් රාලහාමි එජාපය වෙනුවෙන් විශාල කැපකිරීමක් ඉටු කළ, ගමට විශාල සේවාවක් ඉටු කළ කෙනෙක්. ඔහුගෙන් ගමට ඉටු නොවූ දේ අප්‍රමාණයි. අදටත් ප්‍රදේශයේ ප්‍රතිසංස්කරණය කොට නොමැති මාර්ග තියෙනවා. වීථි ලාම්පුවක් අවශ්‍ය තැනට නැහැ.

තියෙන එකවත් නිසි නඩත්තුවක් නැහැ. ඒ අඩුපාඩු ජනතාවට සපුරාදීමට මම මෙවර බද්දේගම ප්‍රාදේශීය සභාවට බද්දේගම හල්පාතොට ප්‍රදේශයෙන් එජාපයේ අලියා ලකුණින් ඉදිරිපත් වෙනවා. මම අදත් හෙටත් සිංහල ජාතිය වෙනුවෙන් ඕනෑම අභියෝගක් භාර ගන්නා තරුණයෙක්.

මා ජනතා සභියකු ලෙස තේරී පත්වුවහොත් සොරකම් කිරීම සහ අයථා මුදල් ඉපැයීමේ චේතනාවෙන් තොරව උපන් ගමට සේවය කිරීම මාගේ එකම පරමාර්ථයයි. ඒ වගේම මට ලැබෙන වේතනයෙන් සෑම වසරකම මාස 12 සඳහාම අඩු ආදායම්ලාභී දුවා දරුවන් වෙනුවෙන් අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමටත් බලාපොරොත්තු වෙනවා."

# ධනාත්මකව හිතන තරුණ පිරිසක් නිර්මාණය කරනවා


තලාව ප්‍රා. සභා අපේක්ෂක සාමවිනිසුරු **ශාන්ත නිශ්ශංක** (එජාප)

**තලාව සමූහ බී.ඩබ්.ඩී. ධර්මකීර්ති**

'කරන සමාජ සේවා කටයුතුවලට බලයක් තියෙනවා නම් වඩා සාර්ථකයි. ඒ වගේම අපේ ගමෙන් මේතාක් කාලයකට ප්‍රාදේශීය සභාවේ කවුරුත් ඉඳල නෑ. අවට ගම්වල පුද්ගලයන් තමයි ප්‍රාදේශීය සභාවේ හිටියේ.

ඒ සේවයෙන් අපට සෑහීමකට පත්වෙන්න බෑ. මෙවර ප්‍රාදේශීය සභා මැතිවරණයෙන් තලාව ප්‍රාදේශීය සභාවට මහබෙල්ලංකඩවල ප්‍රදේශයෙන් එක්සත් ජාතික පක්ෂ අපේක්ෂක විදියට මම ඉදිරිපත් වෙනවා. ගමේ විශාල ප්‍රශ්න ගැටලු ප්‍රමාණයක් තියෙනවා.

ඉතින් ගමට වැඩ කරන්න ඕනෑ. මම ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනයේ හිටපු සභාපතිවරයෙක්. ගමේ සහ ප්‍රදේශයේ ස්වේච්ඡා සංවිධානවල විශාල ප්‍රමාණයක ක්‍රියාකාරී සභාපති කෙනෙක් වෙලා ඉඳලා තියෙනවා.



ගමට සහ ප්‍රදේශයට මගේ ශක්තියෙන් ගොඩක් වැඩ කරලා තියෙන්නේ. 1984 මැතිවරණයට මම ඉදිරිපත් වුණේ විජය කුමාරතුංග මහත්තයාගේ පක්ෂයෙන්. ඒ වගේම රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ පක්ෂයට මං හරි ආදරෙයි.

ඒ දැක්ම හරි නිවැරැදියි. පවතින රජයේත්, ඒ පක්ෂයේත් අඩුපාඩු තියෙනවා. ඒවත් නැති කරගෙන හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ දැක්මත් එක්ක ඉදිරියට යන්න තමයි මගේ බලාපොරොත්තුව. අපේ ගම්වල ජනතාවගේ භෞතික පැත්ත හදන්න ඕනෑ තරම් අය ඉන්නවා. හැබැයි මනුස්සයන්ගේ මනස සංවර්ධනය, ධනාත්මක චින්තනය හදන්න කවුරුවත් නැහැ.

මට ඕනේ එතැනට එන්න තරුණ පිරිසක් හා ධනාත්මකව හිතන්න පුළුවන් පුරවැසියන් පිරිසක් හදන්නයි.'

# මැදවච්චියට අවශ්‍ය ජනතාවාදී ප්‍රා.සභාවක්: නීති අවනීති කළ අයට ඉදිරිය සුබ නෑ

මැදවච්චිය ප්‍රා. සභා අපේක්ෂක - සරසවි ශිෂ්‍ය **ඉසුරු විරාජ** (සජබ)

**කැබිතිගොල්ලෑව විශේෂ එස්.පී. උබේපාල**

'යුද්ධයෙන් බැට කෑ ජනතාවක් ජීවත්වෙන ගම්මාන රැසක් පිහිටි මැදවච්චිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇතැම් ගම්මානවල සංවර්ධනය හීනයක්. සරසවි සිසුවකු ලෙස මම දේශපාලනයට පිවිසීමට තීරණය කළේ තවත් ගම්මානවල ජනතාව පටු අරමුණු ඇති දේශපාලකයන් විසින් කරනු ලබන රැවටීම්වලින් බේරා ගන්නයි. සමගි ජන බලවේගයෙන් මැදවච්චිය ප්‍රාදේශීය සභාවේ පුල්එළිය කොට්ඨාසයේ අපේක්ෂක විදියට මම ඉදිරිපත් වෙන්නේ ජයග්‍රහණයෙන් පසු මේ ගම්මානවලට විශාල වැඩ කොටසක් කිරීමේ අපේක්ෂාවෙනුයි. ඇතැම් දේශපාලනඥයන් දිවයිනම සංවර්ධනය කරන බව පැවැසුවත් මැදවච්චිය, පුල්එළිය අමතක කර තිබෙනවා. මැදවච්චිය සභාව ජනතාවාදී සභාවක් වීමේ අවශ්‍යතාවය දැන් එළැඹ තිබෙනවා. එහි නීති අවනීතියට පෙළගස්සමින් ඇතැම් බලධාරීන් කටයුතු කරන බව වෙළෙඳ ප්‍රජාව සහ මැදවච්චියේ 57,000කට ආසන්න ජනතාවක් මේ වන විට එක හඬින් ප්‍රකාශ කරනවා. එවැනි බලධාරීන් පිළිබඳ අප ඉදිරියේදී නීතිය ක්‍රියාත්මක කරනවා.'

